සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

13 ශ්‍රේණිය

නිර්මාණාත්මක සන්නිවේදනය

පුනරීක්ෂණ අභ්‍යාස

1) අතීත මිනිසා නිර්මාණශීලීත්වයෙන් හා නවෝත්පාදන සන්නිවේදන ශක්තියෙන් යුතු වූ බවට තහවුරු කරන සාධක මොනවාද?

2) නිර්මාණාත්මක සන්නිවේදනය යන්නට සරල අර්ථ කථනයක් ඉදිරිපත් කරන්න.

3) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය විසින් "නිර්මාණය" යන්න නිරවචනය කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

4) ප්‍රකට සාහිත්‍යධරයෙකු වන ලියෝ තෝල්ස්තෝයි විසින් "කලාව" යන්න අර්ථ කථනය කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

5) සන්නිවේදනය හා නිර්මාණශීලීත්වය අතර ඇති සම්බන්ධතාවය උදාහරණ 3ක් මඟින් පැහැදිලි කරන්න.

6) නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය කරුණු 4ක් මඟින් පැහැදිලි කරන්න.

7) නිර්මාණශීලීත්වයේ මූලිකාංග නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

8) ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු වූ ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මාණශීලීත්වය පිළිබඳව ඉදිරිපත් කර ඇති කරුණු 7ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

9) භාෂා භාවිතය තුළින් පුද්ගලයෙකු තුළ ඇති වූ හැකියාවන් 4ක් දක්වන්න.

10) භාෂා භාවිතය නිසා රටක සමාජයක ඇති වූ වෙනස්කම 5ක් දක්වන්න.

11) පුවත්පත් මාධ්‍ය තුළ නිර්මාණාත්මක භාෂාව භාවිත වන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

12) ගුවන්විදුලි මාධ්‍ය තුළ නිර්මාණශීලී භාෂා භාවිතය තුළ අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

13) රූපවාහිනි මාධ්‍යයේ ලක්‍ෂණ 5ක් දක්වන්න.

14) සිනමා නිර්මාණයක සාර්ථක අසාර්ථකභාවය නිර්ණය කිරීම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

15)රංග කලාවේ මූලිකාංග  නමකර කෙටියෙන් හඳුන්වන්න.

16) රංග භූමි නිර්මාණයේ දී අනුගමනය කළ යුතු පියවර දක්වන්න.

17) ජනශ්‍රැති හා ජන කලා යනු මොනවාද?

18) නිර්මාණාත්මක සන්නිවේදන කාර්යයේදදී ජනශ්‍රැති හා ජනකලා භාවිතයේ වැදගත්කම කරුණු 4ක් මඟින් දක්වන්න.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

19) පෙර නොවූ විරූ දෙයක් , චිත්ත රූප මවමින් , යම් නිමවුමක් ලෙස ඉදිරිපත් කිරීම නිර්මාණයක් ලෙස අර්ථ කථනය කරනු ලැබුයේ

1. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා ය.
2. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ ය.

3. ලියෝ තෝල්ස්තෝයි ය.

4. ලියනාඩෝ ඩාවින්චි ය.

5. සුමංගල ශබ්ද කෝෂයේ ය.

20) නිර්මාණශීලීත්වයේ මූලිකාංගයක් නොවනනේ

1. නිර්මාණ ශිල්පියායි.

2. නිර්මාණයයි.

3. නිර්මාණාත්මක රචනයයි.

4. නිර්මාණාත්මක විචාරයයි.

5. නිර්මාණාත්මක චින්තනයයි.

21) අන්තර් පුද්ගල සන්නිවේදනය තුළ ප්‍රබල නිර්මාණශීලි සන්නිවේදකයෙකු

වීමට හැකි අවස්ථාවක් වන්නේ

1. කවි පන්තියක් නිර්මාණය කිරීම.

2. බස් රථයක් සඳහා ප්‍රවේශ පත්‍රයක් මිලදී ගැනීම.

3. සිතුවමක් නිර්මාණය කිරීම.

4. ගීතයකට රංගනයක් ඉදිරිපත් කිරීම.

5. ආදරවන්තියකට ලිපියක් ලිවීම.

22. ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු වන ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මාණයක අන්තර්ගත විය යුතු කරුණක් ලෙස දක්වා ඇත්තේ

1. පරිකල්පනයයි.

2. සාධු ගමනයයි.

3. ප්‍රත්‍යක්ෂණයයි.

4. සතතාභ්‍යාසයයි.

5. සංජානනයයි.

23. නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට බලපාන සාධකයක් වන්නේ

1. විවේචනාත්මක බවයි.

2. සංජානනයයි.

3. ප්‍රදීපනයයි.

4. සංවේදනයයි.

5. සත්‍යාපනයයි.

24. ලොව ඇති ප්‍රධානතම කලා මාධ්‍ය වන්නේ

1. සාම්ප්‍රදායික මාධ්‍යයයි.

2. සමාජ මාධ්‍යයයි.

3. ගුවන් විදුලි මාධ්‍යයයි.

4. රූපවාහිනී මාධ්‍යයයි.